# 25 බෞද්ධ දිවිය ඔප කරන සැදැහැ ගුණය

සෑම මසක ම විදුහලේ පැවැත්වෙන පෙර පොහොය වැඩ සටහන සඳහා මෙවර ද ගුරුසිසු දෙ පිරිසගේ ම ඉහළ සහභාගිත්වයක් පෙන්නුම් කෙරිණි. විදුහලේ ප්‍රධාන ශාලාව දම්සභා මණ්ඩපයක සිරිය ඉසිලී ය. උදෑසන අටසිල් සමාදන් වූ ගුරුසිසු පිරිස මෛත්‍රී භාවනාව වැඩීමෙන් අනතුරුව මඳ විවේකයක් ගත්හ. ඉක්බිති ව ඔවුහු ධර්ම දේශනාවක් ශ්‍රවණය කළහ. දවසේ ආගමික වැඩසටහනට අනුව ඊළඟට පැවතියේ "ධර්ම සාකච්ඡා වාරය" යි. එකී ධර්ම සාකච්ඡාව මෙහෙයවීම සඳහා විදුහලේ ධර්මාචාර්ය ස්වාමීන් වහන්සේ ශාලාවේ පැනවූ අසුන වෙත වැඩම කළහ.

එහි දී උන් වහන්සේ සාකච්ඡාව ආරම්භ කෙළේ මෙසේ සඳහන් කරමිනි. "පින්වත් දරු දූරියනි, අද අපේ ධර්ම සාකච්ඡාවේ මාතෘකාව 'සද්ධාව' යි. එලෙස මාතෘකාව දෙසට පිරිසගේ අවධානය යොමු කළ ධර්මාචාර්ය හිමියෝ ධර්ම සාකච්ඡාව සඳහා ප්‍රවේශයක් ලෙස මෙබඳු හැඳින්වීමක් ඉදිරිපත් කළහ.

> බුදු සමයෙහි සද්ධාවට හිමිවන්නේ ඉතා ම වැදගත් තැනක්. බෞද්ධ ජීවිතයකට පදනම වැටෙන්නේ සද්ධාව තුළිනුයි. **බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි මනා අවබෝධයෙන් යුක්ත ව පැහැදීමට පත් වීම "සද්ධාව"** කියල කෙටියෙන් ම හඳුන්වන්න පුළුවන්.

සද්ධාව ඉතා ම සරලව විග්‍රහ කෙරෙන සූත්‍රයකි, කසීභාරද්වාජ සූත්‍රය. කසීභාරද්වාජ සුප්‍රසිද්ධ බ්‍රාහ්මණ ගෝත්‍රිකයකු වුවත්, කෘෂි කර්මාන්තයෙන් දිවි පෙවෙත රැක ගත්තෙක්. බමුණාගේ වප් මඟුල් දිනය උදා වුණා. එදින පෙරවරුවේ බුදු රජාණන් වහන්සේ එම වප් මඟුල් උත්සවය පැවැති ස්ථානයට වැඩම වීම සුවිශේෂී සිද්ධියක්. මේ අවස්ථාවේ දී බමුණා හා බුදුරදුන් අතර වූ සාකච්ඡාව තමයි, කසීභාරද්වාජ සූත්‍රයේ අන්තර්ගත වෙන්නෙ. පළමු ව බමුණා බුදුරදුන්ට මෙහෙම කියනව.

"භවත් ගෞතමයනි, මම සී සාමි. වපුරමි. සී සා වපුරා වළඳමි. ඔබත් සී සා වපුරා වළඳන්න."

"බමුණ, මමත් සී සාමි, වපුරමි. වපුරා වළඳමි" යි බුදුරජාණන් වහන්සේ වදාළහ.

එවිට බමුණා නැවතත්, මෙහෙම කීවා.

"භවත් ගෞතමයන්ගේ ගොවි උපකරණ මම නො දකිමි. අපට ගෞතමයන්ගේ එම උපකරණ මොනවා දැයි වදාරනු මැනවි."

ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව වදාරනවා.

**"සද්ධා බීජං තපෝ වුට්ඨි, පඤ්ඤා මේ යුගනංගලං,**

**හිරි ඊසා මනෝ යොත්තං, සති මේ ඵාල පාචනං."**

"මාගේ සද්ධාව බිජුවටයි. තපස වැසි දහර වෙයි. ප්‍රඥාව විය නගුල් වෙයි. හිරිය (ලජ්ජාව) නගුලිසයි. සිත වියදණ්ඩ වෙයි. සිහිය මාගේ හී වැල හා කෙවිටයි."

මෙහි දී තව දුරටත් බමුණාට කරුණු පැහැදිලි කළ බුදුරජාණන් වහන්සේ, "ම විසින් මෙසේ කරන ලද සී සෑමෙහි අමාඵල තිබෙනව. මෙම කෘෂි කර්මාන්තය කොට සී සා හැම දුකෙන් මිදෙනව." යනුවෙන් දේශනා කළා.

මෙම දේශනාව මනා ව තේරුම් ගත් කසීභාරද්වාජ බමුණා තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත් ව පසු ව පැවිදි උපසම්පදාව ද ලැබුවා.



**ඔබත් ගොවිතැන් කර වළඳන්න.**

මේ කථා පුවතෙන් අපට පැහැදිලි වෙන්නෙ කුමක් ද? සී සාන උපකරණ සියල්ල සම්පූර්ණ කරගෙන සිටියත් වැපිරීමට බීජ නොමැති නම් වගාව කරන්න බැහැ. වී වගාවේ මූලික පදනම බීජ වැපිරීම. ඒ තුළිනුයි අස්වැන්න ලැබෙන්නෙ. ඒ වගේ ම තමයි, බෞද්ධ ජීවිතයේ මූලික පදනම සද්ධාව. සද්ධාව නැතිව වෙන මොන ගුණාංගය

තිබුණත් වැඩක් වන්නෙ නැහැ. සද්ධාව බීජයකට උපමා කරල තිබෙන්නෙ ඒක නිසයි. නිවන නමැති අස්වැන්න ලබන්න නම් සද්ධාව නමැති බීජය අවශ්‍යමයි."

ධර්මාචාර්ය ස්වාමීන් වහන්සේ එලෙස ධර්ම සාකච්ඡාව සඳහා ප්‍රවේශයක් ලබා දෙමින් සිසු දරු දැරියන්ට ද සාකච්ඡාවට සහභාගි විය හැකි බව දන්වා සිටියහ. ඒ අනුව සිසුන් කිහිපදෙනෙක් සද්ධාව පිළිබඳ තමතමන් තුළ වූ ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීම සඳහා මෙය අවස්ථාවක් කර ගත්හ.

**අමිල:** ගරු ස්වාමීන් වහන්ස, අපි සර්ධාව කියලයි ඔය වචනය මීට කලින් අහල තිබෙන්නෙ. ඒක ඔබ වහන්සේ උච්චාරණය කරනවට වඩා තරමක් වෙනස් කියලයි, මට හැඟෙන්නෙ. මෙහි වෙනසක් තිබෙනව ද?

**ස්වාමීන් වහන්සේ:** ඔව්, භාවිතයේ දී සමහරු "සද්ධා" හෝ "ශ්‍රද්ධා" යන වචන වෙනුවට "ශර්ධා" හෝ "සර්ධා" යනුවෙන් ව්‍යවහාර කරනවා. ඒක වැරදි යෙදුමක්. පාලි භාෂාවේ 'සද්දහතී ති සද්ධා' කියලයි, මේ "සද්ධා" කියන වචනය නිර්වචනය කෙරෙන්නෙ. තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගැනීමයි සද්ධාව. මැනවින් තෙරුවන් ගුණ පිළිගැනීම.

**සුජාතා:** ස්වාමීන් වහන්ස, දහම් පාසලේ දි අපි ඉගෙනගෙන තිබෙනව සද්ධාවත් සමග භක්තිය කියන වචනය යෙදීම වැරදියි කියල. නමුත් නොදැනුවත්ව ම වගේ " අපි සද්ධා භක්තිය පෙරටු කරගෙන කුසල් කරමු." කියන යෙදුම භාවිත කරනව. මේ වචන දෙකේ ලොකු වෙනසක් තිබෙනව ද?

**ස්වාමීන් වහන්සේ:** වැදගත් ප්‍රශ්නයක් යොමු කළේ. යම් දෙයක් පිළිබඳ භක්තියක් හෙවත් ඇදහීමක් අවශ්‍ය වන්නෙ දැකීමක් නොමැති වූ විටයි. යමක් තේරුම් ගැනීමෙන් පසු ව ඒ ගැන භක්තිය හෝ ඇදහීම පිළිබඳ අවශ්‍යතාවක් ඇති වන්නේ නැහැ. සරල උදහරණයක් කියන්නම්. මා අත මැණිකක් තිබේ යැයි කීවොත්, ඒක ඔබට දැක ගැනීමට හැකි වෙනවා. එතකොට භක්තිය හෝ ඇදහීම හෝ පිළිබඳ ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. එසේ වූයේ, ප්‍රත්‍යක්ෂ ලෙස මැණික දක්නට ලැබුණු නිසයි. ඇතැම් ආගමික ඉගැන්වීම්වල පදනම වන්නේ භක්තිය. එහෙත් බුදු සමයේ මුල් තැන ලැබෙන්නේ භක්තියට නොව අවබෝධයට. එම නිසා බුදු සමයේ ඉගැන්වෙන "සද්ධාව" යන වචනය "භක්තිය" "ඇදහීම" යන වචන හා සමාන නො වන බව අප වටහා ගන්න ඕන.

**නාලක:** අපේ හාමුදුරුවනේ, ගුවන් විදුලි ධර්ම දේශනාවක දී අහන්නට ලැබුණා ශ්‍රද්ධාවේ කොටස් කීපයක් ගැන. අපි කැමතියි ඒ ගැනත් දැන ගන්න.

**ස්වාමීන් වහන්සේ:** බොහොම හොඳයි. මෙතැන දි මා සද්ධාවෙ බොහොම වැදගත් කොටස් දෙකක් කියල දෙන්නම්. එකක් තමයි **අමූලිකා සද්ධාව**. අනෙක **ආකාරවතී සද්ධාව**. මෙයින් අමූලිකා සද්ධාව කියල කියන්නෙ තෙරුවන් කෙරෙහි හරි අවබෝධයක් නැති ව ඇති කර ගන්න සද්ධාව. ඒකෙ කිසි ම පදනමක් නැහැ. යම්කිසි කෙනෙක් කියනව නම් "මේ ධර්ම කරුණු ගැන මා දන්නෙ නැහැ. ඒත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි තිබෙන අසීමිත පැහැදීම නිසා මා මේ කරුණු පිළිගන්නව" කියල එතැන අවබෝධයට වඩා විශ්වාසයට, ඇදහීමට තමයි, මුල්තැන දීල තිබෙන්නෙ.

අන්ධයින්ගේ පෙරහරකටයි මේක උපමා කරල තිබෙන්නෙ. මුලින් යන්නෙත් මැදින් යන්නෙත් අගින් යන්නෙත් අන්ධයන්. එකිනෙකාගෙ අත අල්ලාගෙන එකිනෙකා පසුපස යන ඔවුන්ගෙන් මුලින් මැදින් හෝ අගින් යන කාටවත් පාර පෙනෙන්නෙ නැහැ. ඔවුන් අවබෝධයෙන් ගමන් කරන්නෙත් නැහැ. කුමන දිසාවකට යන්නේ දැයි දන්නේ නැහැ. මෙබඳු අවබෝධයෙන් තොර අන්ධානුකරණය බෞද්ධ සද්ධාව නො වෙයි. ඒ නිසා බුදු දහම මේ අමූලිකා සද්ධාව ප්‍රතික්ෂේප කර තිබෙන බව කවුරුත් හොඳින් වටහා ගන්න ඕනෙ. අමූලිකා කියන්නෙ මුලක් නැති, පදනමක් නැති, සාධාරණ හේතුවක් නැති කියන එකයි.

බුදු දහම සෑම විටෙක ම උසස් ලෙස සලකන්නේ "ආකාරවතී සද්ධාව" යි. ආකාරවතී සද්ධාව නම් හේතු යුක්ති ඇති ව කරුණු දැන, දැක, ඇති කර ගන්නා පැහැදීමයි.

**විනීතා:** ස්වාමීන් වහන්ස, මට තිබෙන ප්‍රශ්නය සෝවාන් ආදී මාර්ගඵලවලට පත් වෙච්ච උතුමන් වහන්සේලා තුළ පවතින්නෙ මොනවගේ සද්ධාවක් ද? කියන එකයි. ඒකෙ, සාමාන්‍ය අපේ සද්ධාවට වඩා වෙනස්කමක් තිබෙනව ද? නැත්නම් සද්ධාව පෘථග්ජන පුද්ගලයන්ට පමණක් සීමා වෙච්ච දෙයක් ද?

**ස්වාමීන් වහන්සේ:** නැහැ. සද්ධාව පෘථග්ජන අයට පමණක් සීමා වුණු දෙයක් නො වෙයි. සද්ධාව ලෞකික ලෝකෝත්තර කියල කොටස් දෙකකට බෙදා දක්වල තිබෙනව. මෙයින් ලෞකික සද්ධාව විටින් විට වෙනස් වෙනවා. සෝවාන් ආදී මාර්ගඵලවලට පත් වූ උතුමන්ගේ සිත්වල යෙදෙන්නෙ ලෝකෝත්තර සද්ධාව. ඒ සද්ධාව "අචල" යි. එහි කිසිදක සෙලවීමක් නැත්නම් අඩු වැඩි වීමක් සිදු වන්නෙ නැහැ. පෘථග්ජන අප කා අතරත් පවතින්නෙ සෙලවෙන (චල) සද්ධාවක්. එය එක් විටෙක ඉහළ මට්ටමකිනුත්, තවත් විටෙක මධ්‍යස්ථවත් ඇතැම් විටෙක ඉතා අඩු මට්ටමකිනුත් පැවතීමට ඉඩ තිබෙනව.

සද්ධාව කියන්නෙ කුමක් ද කියල මේ දරුවො දැන් දන්නව. සද්ධාව නුවණින් යුක්ත ව අවබෝධයෙන් ඇති කර ගත යුත්තක්. සද්ධාව ශිෂ්‍ය ජීවිතයටත් අත්‍යවශ්‍ය ම දෙයක්. සද්ධාවකින් යුක්ත ව කටයුතු කරන කෙනාගෙ සිත දූෂණය වන්නට ඉඩක් ලැබෙන්නෙ නැහැ. සිත බොහොම පිරිසිදුයි.

සද්ධාව අපගේ ජීවිතයට ආලෝකයක් වුණොත් අප අපේක්ෂා කරන යහපත් අරමුණු වෙත ළඟා වීමට ඒක පහසු මගක් වෙනව. එසේ ම එය අපගේ මෙලොව ජීවිතය වගේ ම පරලොව ජීවිතය සාර්ථකත්වයට පත් කරන්නටත් හේතුවක් වෙනවා. ත්‍රිවිධ රත්නය පිළිබඳ අව්‍යාජ සද්ධාව ඇති අයට ත්‍රිවිධ රත්නයේ පිහිටාරක්ෂාව ලැබෙනවා. මෙලොව ජීවිතය හැම අතින් ම සාර්ථක වෙනවා. ඒ වගේ ම නිවන් මගෙහි ගමන් කිරීමට හැකි වෙනවා" යැයි පවසමින් ස්වාමීන් වහන්සේ ධර්ම සාකච්ඡාව අවසන් කළහ.

## සාරාංශය

සද්ධාව බෞද්ධ ජීවිතයේ පදනමයි. තෙරුවන් කෙරෙහි මනා අවබෝධයකින් යුක්ත ව පැහැදීමෙන් ක්‍රියා කිරීම සද්ධාව ලෙස හැඳින්වේ. එය ප්‍රඥාවත් සමග ම එකට ගමන් කරන්නක් විය යුතු ය. බුදු දහම මගින් අගය කොට ඇත්තේ අන්ධානුකරණයෙන් තොර ප්‍රඥාව මුල් කර ගත් ආකාරවතී සද්ධාවයි. අන්ධ විශ්වාසයෙන් යුක්ත ව ඇති කර ගන්නා පැහැදීම හැඳින්වෙන්නේ අමූලිකා සද්ධා කියලයි. එය බුදු දහමේ අගය කෙරෙන්නේ නැත.

සද්ධාව පුද්ගලයකුගේ මෙලොව හා පරලොව ජීවිතය සෑම අතින් ම සාර්ථක කර ගැනීමටත් නිවන් මගට පිවිසීමටත් උපකාරවත් වෙයි.

## ක්‍රියාකාරකම්

01. සද්ධාව භක්තියෙන් වෙනස් වන්නේ කෙසේ දැයි, පැහැදිලි කරන්න.

02. අමූලිකා සද්ධා, ආකාරවතී සද්ධා යන දෙක වෙන වෙන ම හඳුන්වන්න.

03. පුහුදුන් පුද්ගලයින්ගේ සද්ධාවෙහි හා මාර්ගඵල ලත් උතුමන්ගේ සද්ධාවෙහි වෙනස පැහැදිලි කරන්න.

## පැවරුම :-

ඔබේ මිතුරු මිතුරියන් ද සමග පාසලේ සිට ගමේ විහාරස්ථානය දක්වා පෙර පොහෝ දිනක මල් පෙරහරක් සංවිධානය කරන්න.